# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

## අධ්‍යයන, අධ්‍යයන සහායක, පරිපාලන කාර්ය මණ්ඩලය, ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සහ සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය

**අයදුම් කරනු ලබන විෂය ක්ෂේත්‍රය/ ක්ෂේත්‍ර පහත සඳහන් දෙපාර්තමේන්තු වලට අදාළ විය යුතු අතර විෂය ක්ෂේත්‍ර, විශේෂ සටහන් හා ඉදිරිපත් කළ යුතු ලේඛන සඳහා ඉංග්‍රීසි පුවත්පත් දැන්වීම හෝ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වෙත යොමු වන්න.**

## අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

**01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය**

### වෛද්‍ය පීඨය

**සායනික විද්‍යා අධ්‍යනාංශය**

**02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (ස්ථිර නොකල) තනතුර, කථිකාචාර්ය (පරිවාස) තනතුර**

### ඉංජිනේරු පීඨය

**විදුලි, විද්‍යුත් හා සන්නිවේදන ඉංජිනේරු අධ්‍යනාංශය**
**ගණිත අධ්‍යනාංශය**

### තාක්ෂණ පීඨය

**ඉංජිනේරු තාක්ෂණ අධ්‍යනාංශය**

### සම සෞඛ්‍ය විද්‍යා පීඨය

**විකිරණශිල්පී සහ විකිරණ චිකිත්සා අධ්‍යනාංශය**

### උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන අධ්‍යනාංශය (KDU-CARE) (පර්යේෂණ තනතුරු)

## දක්ෂිණ මණ්ඩපය - සූරියවැව

### නිර්මිත පරිසරය සහ අවකාශීය විද්‍යා පීඨය

**ප්‍රමාණ සමීක්ෂණ අධ්‍යනාංශය**
**කාර්මික තත්ත්ව කළමනාකරණ අධ්‍යනාංශය**

### පරිගණක පීඨය

**පරිගණක ඉංජිනේරු අධ්‍යනාංශය - රත්මලාන පරිශ්‍රය**
**තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය - සූරියවැව පරිශ්‍රය**

**03. උපදේශක තනතුර - II ශ්‍රේණිය**

### ඉංජිනේරු පීඨය

**විදුලි, විද්‍යුත් හා සන්නිවේදන ඉංජිනේරු අධ්‍යනාංශය**
**යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යනාංශය**
**ගගන ඉංජිනේරු අධ්‍යනාංශය**

### ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන පීඨය

**උපායමාර්ගික අධ්‍යයන අධ්‍යනාංශය**

### පරිගණක පීඨය

**පරිගණක ඉංජිනේරු අධ්‍යනාංශය - රත්මලාන පරිශ්‍රය**
**තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය - සූරියවැව පරිශ්‍රය**

### පරිපාලන කාර්ය මණ්ඩලය

**01. අභ්‍යන්තර විගණක තනතුර**

### ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය

**01. කළමනාකරණ සහකාර (ලිපිකරු සේවා) III ශ්‍රේණිය - රත්මලාන පරිශ්‍රය සහ සූරියවැව පරිශ්‍රය**

**02. පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය - රත්මලාන පරිශ්‍රය**

### සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය

**01. විදුලි කාර්මික II ශ්‍රේණිය - රත්මලාන පරිශ්‍රය සහ සූරියවැව පරිශ්‍රය**

### වැටුප් පරිමාණ

**අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය**

01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුර
U-AC 3 (I) Rs. 91,310 - 7x2,170 – 106,500 p.m. +
(176% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර
U-AC 3 (II) Rs. 79,360 - 11x1,630 – 97,290 p.m. +
(176% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

03. කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර
U-AC 3 (III) Rs. 69,580 - 5x1,630 – 77,730 p.m. +
(156% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

04. කථිකාචාර්ය (පරිවාස) තනතුර
U-AC 3 (IV) Rs. 54,600 - 10x1,335 – 67,950 p.m. +
(140% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

05. උපදේශක II ශ්‍රේණිය තනතුර
U-AS 1 (I) Rs. 48,385 - 19x690 - 61,495 p.m. + (වෙනත් අනුමත දීමනා)

### පරිපාලන කාර්ය මණ්ඩලය

01. අභ්‍යන්තර විගණක තනතුර
U-EX 3 (II) Rs. 95,320 - 7x2,170; 11x2,700 - 140,210 p.m. + (Rs. 12,800 ජීවන වියදම් දීමනාව + Rs. 5,000 මාසික දීමනාව + 45% අනධ්‍යයන දීමනාව + 20% අමතර දීමනාව සහ වෙනත් අනුමත අනෙකුත් දීමනා)

### ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය

01. කළමනාකරණ සහකාර (ලිපිකරු සේවා) III ශ්‍රේණිය/ පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය :-
U-MN I (III) – Rs. 30,725 – 17x300 – 35,825 p.m. + (12,800 ජීවන වියදම් දීමනාව + Rs. 5,000 මාසික දීමනාව + 45% අනධ්‍යයන දීමනාව + 20% අමතර දීමනාව සහ වෙනත් අනුමත අනෙකුත් දීමනා)

### සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය

01. විදුලි කාර්මික II ශ්‍රේණිය :-
U-PL 3 (III) - Rs. 29,915 – 16x270 – 34,235 p.m. + (Rs. 12,800 ජීවන වියදම් දීමනාව + Rs. 5,000 මාසික දීමනාව + 45% අනධ්‍යයන දීමනාව + 20% අමතර දීමනාව සහ වෙනත් අනුමත අනෙකුත් දීමනා)

### වෙනත් ප්‍රතිලාභ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර හා ඊට ඉහළ තනතුරු සඳහා වර්ෂ 7 ක සේවා කාලයකින් පසු වැටුප් සහිතව වර්ෂයක කාල සීමාවක් සඳහා හෝ වැටුප් රහිතව වර්ෂ 2 ක කාල සීමාවක් සඳහා සප්තවාර්ෂික නිවාඩු, සුදුසුකම් ලත් තනතුරු සඳහා ඉහත සඳහන් අධ්‍යයන දීමනා සහ 35% පර්යේෂණ දීමනාව, සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය, පාරිතෝෂික දීමනාව සඳහා හිමිකම, නොමිලේ ලබා දෙන සෞඛ්‍ය හා ජීවිත රක්ෂණය, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාලයීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර, සුබ සාධක ප්‍රවාහන සේවය සහ වෙනත් වරප්‍රසාද.

### පොදු කොන්දේසි

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් තෝරා ගැනීම ඒ ඒ තනතුරෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වනතෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරනු ඇත.
3. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් **(www.kdu.ac.lk)** භාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතික වල සහතික කළ ඡායා පිටපත් සහිතව **2024 මාර්තු මස 31** වෙනි දිනට හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවීම හෝ ගෙනවිත් භාර දීම කළ යුතුය.
4. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙලවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
5. අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.
6. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.
7. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් **(www.kdu.ac.lk)** භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාල තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිභාහිරව එවනු ලබන අයදුම්පත් සහ ඉහත අංක 06 හි ලබාදී ඇති උපදෙස් අනුගමනය කර නොමැති අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.
8. අපේක්ෂකයින් අයදුම් කිරීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවා අවසන් වන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.
9. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ඇත.
10. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරි කිරීමට හැකියාව තිබිය යුතුය.
11. අයදුම්කරුවන් තෝරාගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදුකරනු ඇත.
12. අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා යොමු කිරීමට හා සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛයන් අනුව වැටුප ගෙවනු ලබන අතර වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ.
14. මෙම තනතුරු ස්ථිර අතර මෙම පත්වීම වසර තුනක (03) පරිවාස කාලයක් සඳහා යටත් වේ.
15. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයන් සහ සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ, සහ ඒවායේ විශේෂ සටහන් හා අදාළ සංශෝධන වෙත යොමු වෙන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (පරිවාස) තනතුර - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 721, 935, 08/2016, 08/2016 (ii), 08/2016 (iii)
- කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 07/2018
- උපදේශක II ශ්‍රේණිය තනතුර - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 725
- අභ්‍යන්තර විගණක තනතුර - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 01/2017
- කළමනාකරණ සහකාර (ලිපිකරු සේවා) III ශ්‍රේණිය - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 06/2018
- පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 07/2019

**අවසාන දිනය 2024. 03. 31**


**අයදුම්පත් එවිය යුතු ලිපිනය**
**ලේඛකාධිකාරී**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය**
**රත්මලාන 10390**
**ශ්‍රී ලංකාව**

**විද්‍යුත් තැපැල : staffrecruit@kdu.ac.lk**

**වැඩි විස්තර සඳහා පිවිසෙන්න : www.kdu.ac.lk**